“කවර මුස්ලිම්වරයකු හෝ වේවා ඔහු වුළූ ධෝවනය කර, එම වුළූ ධෝවනය විධිමත්ව ඉටු කර, පසුව නැගිට තම හදවත හා තම මුහුණ රකආත් දෙකක් ඉටු කිරීම සඳහා යොමු කරවා, ඒ දෙක ඉටු කරන්නේ ද ඔහුට ස්වර්ගය අනිවාර්යය වනු මිස වෙනත් කිසිවක් නැත.”

උක්බා ඉබ්නු ආමිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තො කරන ලදී. ඔටුවන් රැකබලා ගැනීම අප වෙත පැවරී තිබිණ. මාගේ වාරය පැමිණියේය. හවස් කාලයේ ගාල් කිරීම සඳහා මම උන් රැගෙන ගියෙමි. එවිට අල්ලාහ්ගේ දූතයාණන් නැගිට ජනයා සමග කතා කරමින් සිටිනු මම දුටුවෙමි. එතුමාගේ එම ප්රකාශයෙන් මම ලබා ගත් දෑ මෙසේ විය: “කවර මුස්ලිම්වරයකු හෝ වේවා ඔහු වුළූ ධෝවනය කර, එම වුළූ ධෝවනය විධිමත්ව ඉටු කර, පසුව නැගිට තම හදවත හා තම මුහුණ රකආත් දෙකක් ඉටු කිරීම සඳහා යොමු කරවා, ඒ දෙක ඉටු කරන්නේ ද ඔහුට ස්වර්ගය අනිවාර්යය වනු මිස වෙනත් කිසිවක් නැත.” එවිට මම “මෙය කෙතරම් අගනේ ද!” යැයි පැවසුවෙමි. එවිට මා අසළ සිටි කෙනෙකු මෙසේ පැවසීය. “මීට පෙර තිබූ දෑ වඩාත් අගනේය” පසුව මම හැරී බැලුවෙමි. එවිට උමර් තුමා: “සැබැවින්ම මම ඔබව දුටුවෙමි. ඔබ සමීපයට අවෙහිය.” යැයි පැවසීය. ඔහු “නුඹලා අතරින් කිසිවකු හෝ වුළූ ධෝවනය කොට එම වුළූ ධෝවනය සම්පූර්ණ කොට පසුව: “අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅන්න
මුහම්මදන් අබ්දුහු වරසූලුහු” (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු
නොමැති බවත් මුහම්මද් තුමාණන් ඔහුගේ ගැත්තා හා දූතයා බවත් මම සාක්ෂි දරමි.) යැයි
පවසා සිටින්නේ ද ඔහු වෙනුවෙන් ස්වර්ගයේ දොරටු අටම විවෘත කරනු ලැබේ. ඔහු කැමති එකකින් එහි පිවිසෙනු ඇත.” යැයි පැවසුවේය. [صحيح] [رواه مسلم]

මිනිසුන් අතර අති වැදගත් මහඟු කරුණු දෙකක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ විස්තර කළහ. පළමුවැන්න: නබි තුමාණන් පෙන්වා දුන් සුන්නා ක්රමයට අනුව කවරෙකු හෝ වුළූ ගෙන, එය විධිමත්ව ඉටු කර, එය නිසි අයුරින් පූර්ණවත් කොට, එමෙන්ම සෑම අවයවයකටම නියමිත ආකාරයෙන් ජලය සපයා පසුව 'අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅන්න මුහම්මදන් අබ්දුල්ලාහි වරසූලුහූ' යැයි පවසා සිටියේ ද ඔහු වෙනුවෙන් ස්වර්ගයේ දොරටු අට විවෘත කරනු ලබන අතර ඔහු ඉන් අභිමත කරන කැමති දොරටුවකින් පිවිසෙනු ඇත. දෙවැන්න: කවරෙකු පූර්ණ ලෙස වුළූ ධෝවනය කර වුළූ කිරීමෙන් පසුව අවංක හා භක්තිමත් මනසකින් යුතුව එමෙන්ම ඔහුගේ මුහුණ ඇතුළුව අනෙකුත් සියලුම ශරීර අවයව අල්ලාහ්ට යටත් කරමින් රකආත් දෙකක් ඉටු කළේ ද ඔහුට ස්වර්ගය අනිවාර්යය වනු මිස වෙනෙකක් නැත.

http://www.sunnah.global/hadeeth/si/show/8388